ET/SSS/2022(2023)/OL/33/S/Q/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# History

# ඉතිහාසය



Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa

The National e-learning Portal for The General Education

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 33 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | | |
|---|---|---|
| ඉතිහාසය | I, II | පැය තුනයි. |
| வரலாறு | I, II | மூன்று மணித்தியாலம் |
| History | I, II | Three Hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## ඉතිහාසය I

සැලකිය යුතුයි:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරාගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1 මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධ තොරතුරු ඇතුළත් පැරණිත ම කෘතිය වන්නේ,

(1) මහාවංසය යි . (2) පූජාවලිය යි. (3) ථූපවංසය යි . (4) දීපවංසය යි.

.2 තමාට පක්ෂපාතීත්වය හා අනුග්‍රහය දැක්වූ නිලධාරියෙකුට කළගුණ සලකනු පිණිස දීමනාවක් ලබා දෙමින් පළමුවන විජයබාහු රජතුමා විසින් පිහිටුවන ලද අභිලේඛනය වන්නේ ,

(1) වල්ලිපුරම් රන්පත යි. (2) පනාකඩුව තඹ සන්නස යි.
(3) ගල්පොත සෙල්ලිපිය යි. (4) බදුලු ටැම් ලිපිය යි.

3. ශ්‍රී ලංකාවේ පැරණි සෙල්ලිපිවල සටහන් කොට ඇති ප්‍රාදේශීය මායිම් පෙන්වූ පැරණි සලකුණු පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) වටාපොත ,ඇත් අඩිය ,හක් ගෙඩිය (2) ,ගොන්කුරය , ඊතලය, සෙංකෝලය
(3) ලියවැල , ඇත්අඩිය ,දුන්න (4) හංසයා ,සෙංකෝලය වටාපොත

4. පහත ස්ථාන අතරින් ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ , තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ මින් කුමක් ද?

(1) මිනිහාගල්කන්ද (2) පතිරාජවෙල
(3) බෙල්ලන්බැඳිපැලැස්ස (4) බටදොඹලෙන

5. මුල් යකඩ යුගය යනුවෙන් හැඳින්වෙන්නේ පහත යුගයන් අතරින් කුමන යුගය ද?

(1) ප්‍රාග් ඓතිහාසික යුගය (2) පූර්ව ඓතිහාසික යුගය
(3) මධ්‍යකාලීන යුගය (4) නූතන යුගය

6. පහත රට තෙත් කලාපයේ ජීවත් වූ මානවයා වැඩි වශයෙන් ආහාරයට ගනු ලැබු වේ,

(1) වල් දෙල් ය.
(2) කැලෑ කෙසෙල් ය.
(3) මිරිදිය මසුන් ය.
(4) ගොඩබිම බෙල්ලන් ය.

7. ශ්‍රී ලංකාවේ මැටි ඔරු සුසාන පිළිබඳ සාධක ලැබුණු ස්ථානයක් වන්නේ ,

(1) ඉබ්බන්කටුව යි.
(2) රංචාමඩම යි.
(3) ගල් සොහොන් කනත්ත යි.
(4) උඩරංචාමඩම යි.

8. පහත A හා B තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද ?

| A | B |
|---|---|
| 1 වඩුවන් විසූ ගම | A කුම්භකාරගාම |
| 2ගොවියන් විසූ ගම | B වඩ්ඩකීගාම |
| 3 ධීවරයින් විසූ ගම් | C කසීකාරගාම |
| | D කේවට්ටගාම |

(1) ABD
(2) ACD
(3) BCD
(4 ) BCA

9. මාතලේ ඇඹුල් අඹේ සෙල්ලිපියේ සඳහන් ප්‍රාදේශීය පාලකයා හඳුන්වා ඇත්තේ කිනම් නමකින් ද ?

(1) පරුමුක
(2) මපුරුමුකා
(3) දූහතර රජු
(4) පොචනි රජ

10. අනුරාධපුර ප්‍රදේශයේ වැසියන්,කාලයක් අතහැර තිබී නැවත වගා අරඹන ලද හේන් හඳුන්වන ලද්දේ,

(1) කනත්ත යනුවෙනි.
(2) පිටබිම් යනුවෙනි.
(3) සේන් යන්වෙනි.
(4) සෙහෙන් යනුවෙනි.

11. ගවයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සිදුකරන කිරිමඩු ශාන්තිකර්මය අදටත් පවත්වන පළාත් වන්නේ,

(1) බස්නාහිර හා මධ්‍යම පළාත් ය.
(2) සබරගමුව හා ඌව පළාත් ය.
(3) සබරගමුව හා බස්නාහිර පළාත් ය.
(4) ඌව හා දකුණු පළාත් ය.

12. ගම්පොළ රාජධානි සමයේ මෙරටට පැමිණි චෙන් හෝ සෙනෙවියා විසින් පිහිටුවන ලද ත්‍රී භාෂා සෙල්ලිපියේ සඳහන් භාෂාවන් ඇතුළත් වරණය කුමක් ද?

(1) චීන ,පර්සියානු , සිංහල
(2) චීන,දෙමළ, ඉංග්‍රීසි
(3) චීන ,පර්සියානු ,දෙමළ
(4) චීන ,අරාබි ,ජපන්

13. ගම්පොළ රාජධානි සමයේදී රචිත සන්දේශ කාව්‍යයන් දෙක වන්නේ ,

(1) සැළලිහිණි හා මයුර සංදේශය යි.
(2) තිසර හා ගිරා සංදේශය යි.
(3) ගිරා හා මයුර සංදේශය යි.
(4) මයුර හා තිසර සංදේශය යි.

14 . ඉබන් බතුතා නම් අරාබි සංචාරකයා මෙරටට පැමිණියේ කිනම් රාජධානි සමයකදී ද ?

(1) අනුරාධපුරය
(2) පොළොන්නරුව
(3) දඹදෙණිය
(4) ගම්පොළ.

15 . ලන්දේසීන් සමඟ සමග ගිවිසුමක් අත්සන් කොට පෘතුගීසීන් ශ්‍රී ලංකාවෙන් පළවාහරින ලද පාලකයා වන්නේ,

(1) පළමු විමලධර්මසූරිය රජු ය.
(2) දෙවන රාජසිංහ රජු ය
(3) සෙනරත් රජු ය..
(4) දෙවන විමලධර්මසූරිය රජු ය.

- පහත වගුව අධ්‍යයනය කර 16, 17 , යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .

| | රජතුමා | | රජ වීමට පෙර හැඳින්වූ නම | | සටන ඇති වූ ස්ථානය |
|---|---|---|---|---|---|
| A | I රාජසිංහ | D | මහා අස්ථාන කුමරු | G | ගන්නෝරුව |
| B | I විමලධර්මසූරිය | E | ටිකිරි කුමරු | H | මුල්ලේරියාව |
| C | II රාජසිංහ | F | කොනප්පු බණ්ඩාර | I | දන්තුරේ |

16. ක්‍රිස්තු වර්ෂ 1638 දී පෘතුගීසි කපිතාන් දියෝ ගෝ ද මේලෝ ට මරු කැඳ වූ සටන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A D හා H (2) A F හා H (3) C D හා G (4) C D හා I

17. ක්‍රිස්තු වර්ෂ 1594 දී කුසුමාසන දේවිය රජ කරවීමට දියත් කළ සටන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A F හා I (2) B F හා I (3) B F හා G (4) C F හා H

18. පෘතුගීසින් පෙරදිග දී ලැබූ දරුණුතම පරාජය ලෙස සැලකෙන සටන ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A E හා H (2) A E හා I (3) B Eහා I (4) C D හා G

19. පුනරුද සමයේ දී මයිකල් ආන්ජලෝ ප්‍රසිද්ධියට පත් වූයේ කවර ක්ෂේත්‍රයට ද?

(1) ප්‍රතිමා කලාවට ය. (2) සාහිත්‍යයට ය.

(3) දේශ ගවේෂණයට ය. (4) වෛද්‍ය විද්‍යාවට ය

20. දේශ ගවේෂණය සඳහා මුලින්ම උනන්දුවක් දැක්වූ රටවල් අඩංගු පිළිතුර තෝරන්න .

(1) ප්‍රංශය හා පෘතුගාලය. (2) එංගලන්තය හා ස්පාඤ්ඤය.

(3) පෘතුගාලය හා ස්පාඤ්ඤය (4) ප්‍රංශය හා එංගලන්තය.

21. ඉන්දියාවේ කැලිකට්වලට පැමිණ "ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු " යැයි ප්‍රකාශ කළ දේශගවේෂකයා කවුද ?

(1) ඇමරිගෝ වෙස්පුචි. (2) ෆර්ඩිනන්ඩ් මැගලන්.

(3) වස්කෝදගාමා. (4) බර්තොලමියු ඩයස්.

22. කාර්මික විප්ලවයත් සමග එංගලන්තයේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇතිවූ දියුණුව සඳහා බලපෑ හේතුවක් වන්නේ,

(1) ප්‍රථම අශ්ව කරත්ත තැපැල් සේවාව ආරම්භ කිරීම
(2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් දුරකථනය සොයා ගැනීම
(3) මැකඩම් ක්‍රමය සොයා ගැනීම
(4) දුම්රිය හා මහා මාර්ග පද්ධතිය දියුණු වීම

23. 1948ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු පිහිටවන ලද ගොවි ජනපද පමණක් ඇතුළත් පිළිතුර වන්නේ ,

(1) කන්තලේ, රිදී බැඳි ඇළ.බත්මැඩිල්ල, දේවහුව
(2) දේවහුව ,කාගම, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය
(3) කන්තලේ ,කාගම ඉරණමඩු,බෙරගම ,
(4) ගිරිතලේ, කන්තලේ, බත්මැඩිල්ල, සොරබොර වැව

**24.** ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතුවක් වන්නේ කුමක් ද?

(1) නිරිතදිග සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීම
(2) ඉන්දියාවේ බටහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැක ගැනීමට එම වරායේ පිහිටීම වැදගත් වීම
(3) ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට මෙම වරාය වැදගත් වීම
(4) ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයේ වරායන් ආරක්ෂා කර ගැනීම

**25 .** මියුරන් කොමිසමේ නිර්දේශයක් වන්නේ ,

(1) ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම.
(2) පොල් ගස් බද්ද ඉවත් නොකර අලුත් බදු වර්ග ඉවත් කිරීම.
(3) බදු එකතු කිරීමට යොදවා සිටි විදේශීය නිලධාරීන් එලෙස ම යොදවා ගැනීම.
(4) ලන්දේසි උසාවි ක්‍රමය අහෝසි කිරීම .

- **26** හා **27** යන ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා **A** සිට **L** දක්වා තොරතුරු උපයෝගී කරගන්න.

| සටනට බලපෑ හේතු | සටනේ නායකයෝ | ආණ්ඩුකාරවරු |
|---|---|---|
| **A** නව අධිකරණ ක්‍රමය | **E** වාරියපොළ ශ්‍රී සුමංගල හිමි | **I** හර්කියුලිස් රොබින්සන් |
| **B** උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම | **F** කැප්පෙටිපොළ දිසාව | **J** ටොරින්ටන් |
| **C** ගම්සභාව අඩපණ වීම | **G** මොල්ලියගොඩ නිළමේ | **K** රොබට් බ්‍රවුන්රිග් |
| **D** නිදහස අහිමි වීම හා රජකු නැති වීම පිළිබඳ පසුතැවීම | **H** ගොංගාලේගොඩ බණ්ඩා | **L**විලියම් ග්‍රෙගරි |

**26.** ක්‍රිස්තු වර්ෂ **1818** නිදහස් සටන හා සම්බන්ධ වන තොරතුරු පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A H හා K (2) B F හා K (3) C E හා J (4) D H හා L

**27 .**ක්‍රිස්තු වර්ෂ **1848** නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A,Jහා L (2) A,H හා J (3) B,C හා K (4) B,F හා I

**28.** විසිවන සියවසේ ආරම්භය වන විට මෙරට නාගරික සහ වතු කම්කරුවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් නායකත්වය ගන්නා ලද්දේ කවුරුන් ද ?

(1) නටේස අයියර් හා ඒස්. ඒ. වික්‍රමසිංහ මහතා
(2) ජේම්ස් පීරිස් මහතා හා නටේස අයියර් මහතා
(3) ඒ. ඊ .ගුණසිංහ මහතා හා පොන්නම්බලම් රාමනාදන් මහතා
(4) ඒ .ඊ .ගුණසිංහ මහතා හා නටේස අයියර් මහතා

**29.** මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර වන්නේ ,

(1) පොල්ගොල්ල හැරවුම යි.
(2) ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය යි.
(3) වික්ටෝරියා ජලාශය ඉදිකිරීමය යි.
(4) බෝවතැන්න ජලාශය ඉදිකිරීම යි

**30.** උදයබානු පුවත්පත හා ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම සම්බන්ධයෙන් වැදගත් වන්නේ පහත සඳහන් කවුරුන් ද ?

(1) සිද්දි ලෙබ්බේ මහතා (2) ආරුමුග නාවලර් තුමා

(3) පොන්නම්බලම් අරුනාචලම් මහතා (4) පොන්නම්බලම් රාමනාදන් මහතා

**31.** බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සිදුවූ දේශපාලන වෙනස්වීම්වලට අනුව I තීරුව හා II තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද ?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ | A ප්‍රථම වරට සීමිත ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම |
| 2. කෘව් මැකලම් ප්‍රතිසංස්කරණ | B නිල නොලත් බහුතරයක් ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීම |
| 3. මැනිං ප්‍රතිසංස්කරණ | C වාර්ගික නියෝජනය අහෝසි කිරීම |
| 4. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ | D රාජ්‍ය වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම |

(1) ACBE (2) BAED (3) CADB ( 4) DABC

**32.** ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතන පිහිටි ප්‍රදේශය දැක්වෙන පිළිතුර වන්නේ,

(1) තලවාකැලේ (2) අගලවත්ත (3) ලුණුවිල (4) බතලගොඩ

- පහත A, B,C හා D වලින් දැක්වෙන ප්‍රකාශ /පද යුගල අධ්‍යයනය කර 33 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A 1 - සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.
2 - පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

B 1 - සරල බහුතර නියෝජන ක්‍රමය.
2 - ඔම්බුඩ්ස්මන්වරයකු පත් කිරීම.

C 1 - පරිසර දූෂණය.
2 - කාර්මීකරණය

D 1- ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රමය.
2 - ඇමරිකන් විප්ලවය

**33.** පළමුවැන්නේ අසාර්ථකත්වය දෙවැන්නේ ආරම්භයට හේතු වන බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද ?
(1) A (2) B (3 ) C (4) D

**34.**දෙවැන්නේ අඩුවීම පළමු වැන්න අවමවීමට හේතුවන බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**35.** දෙවැන්න පළමුවැන්න බිහිවීමට හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ යුගලය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

**36.**පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධයක් නොමැති ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**37 .1917** මාර්තු විප්ලවයෙන් අනතුරුව රුසියාවේ පාලන බලය හිමිකරගත් සටන්කාමී නායකයා කවුරුන් ද?

(1) කෙරෙන්ස්කි (2) වී .අයි. ලෙනින්

(3) ලියෝන් ට්‍රොස්කි (4) ජෝෂප් ස්ටාලින්

- පහත A, B හා C යටතේ ඇති තොරතුරු ඇසුරෙන් 38 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න

A - කොමියුනිස්ට් වාදය
B - ෆැසිස්ට්වාදය
C - ලිබරල් වාදය

**38.** ඉතාලියේ මුසෝලිනී සම්බන්ධෙයන් නිවැරදි වන්නේ ,

(1) A , B හා C සත්‍ය වේ. (2) A හා C අසත්‍ය වන අතර B සත්‍යය වේ .
(3) A,,B හා C අසත්‍ය වේ. (4) A , C සත්‍ය වන අතර B අසත්‍ය වේ .

**39** එක්සත් ජාතින්ගේ සංවිධානයේ නිෂේධ බලය හිමි රටවල් පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, සෝවියට් සංගමය, ප්‍රංශය , චීනය.
(2) ජර්මනිය ,ඇමරිකා එක්සත් ජනපදය,සෝවියට් රුසියාව,චීනය,මහා බ්‍රිතාන්‍ය.
(3) ඇමරිකා එක්සත් ජනපදය,සෝවියට් රුසියාව,චීනය,මහා බ්‍රිතාන්‍ය,ඉන්දියාව.
(4) ඇමරිකා එක්සත් ජනපදය,සෝවියට් රුසියාව,චීනය ,මහා බ්‍රිතාන්‍ය,ජපානය.

**40.** දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව තම දේශපාලන කඳවුරේ ජයග්‍රහණය සඳහා උපායශීලීව කටයුතු කිරීමේ න්‍යාය භාවිත කළ රටවල් දෙක වන්නේ,

(1) ජර්මනිය හා ඉතාලිය. (2) ජර්මනිය හා ඇමරිකා එක්සත් ජනපදය.

(3) ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය (4) ඇමරිකා එක්සත් ජනපදය හා රුසියාව

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 33 | S | II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

| | |
|---|---|
| ඉතිහාසය | I, II |
| வரலாறு | I, II |
| History | I, II |

ඉතිහාසය II

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(I) දඹකොළපටුන, ඌරාතොට, මන්නාරම් දූපත, පුත්තලම, ගෝකණ්ණ, ගාල්ල නදී , මහනුවර, සොරබොර වැව, මාදුරුඔය ජලාශය, කප්පකන්දර නදී, බුන්දල ,කොළඹ. ( ලකුණු 12)

(II) පිලිපීන් දූපත්, බතාවිය, මලක්කා සමුද්‍ර සන්ධිය, සූවස් ඇළ මාර්ගය, කොන්ස්තන්තිනෝපලය ඉතාලිය (ලකුණු 06)

(ආ) (I) පහත A B C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් හා ඉසබෙලා රැජිනගේ අනුග්‍රහය යටතේ බටහිර ඉන්දීය දූපත් සොයාගත් දේශ ගවේෂකයාගේ නම

B. ශ්‍රී විජය රාජසිංහ රජතුමාගෙන් ආරම්භ වූ නව රාජවංශය

C. නිසි කලට සීසෑම නොකරන පුද්ගලයින්ට දඩයක් නියමකරමින් පිහිටුවන ලද ටැම් ලිපිය

D. ඇමරිකන් විප්ලවයේ ආරම්භය ලෙස සැලකෙන සිදුවීම (ලකුණු 04)

- **A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**



**(II)** **1.** **A** රූපයෙන් දැක්වෙන නිමැවුම කුමන කාර්යයක් සඳහා යොදාගන ඇත් ද?

**2.** මෙහි මැටි නළ සවිකර තිබුනේ කුමක් සඳහා ද ?

**3.** මෙහි දහනයට අවශ්‍ය අඟුරු ලබාගැනීම සඳහා යොදාගත් ගස් වර්ගය කුමක් ද?

**4.** මෙවැන් නිර්මාණ දැකිය හැකි ස්ථානයක් නම් කරන්න

(ලකුණු 04)



**(III)** **1.** **B** රූපයෙන් දැක්වෙන ආයතනය හඳුන්වන නම කුමක්ද?

**2** මෙහි ප්‍රධානියා කවුද?

**3.** එතුමා පත්කරනු ලබන්නේ කවුරුන් විසින් ද?

**4.** මෙම ආයතනයට පහළින් ඇති අධිකරණ ආයතනය නම් කරන්න.

(ලකුණු 04)

**02** **(I)** ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න.(ලකුණු 03)

**(II)** ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ආහාර සපයාගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙක නම් කරන්න (ලකුණු 04)

**(III)** මුල් ඓතිහාසික යුගයේ පැරණි ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධක දෙකක් විස්තර කරන්න (ලකුණු 05)

**(IV)** ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ ජනතාව අතර පැවති අවමංගල අභිචාර විධි තුනක් උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**03. (I)** ගම්කගේ කාර්යයන් තුනක් සඳහන් කරන්න **(ලකුණු 03)**

**(II)** ශ්‍රී ලංකාවේ විකේන්ද්‍රගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත වීමේ ක්‍රියාවලියේ දී පහත සඳහන් කාර්යයන් සිදු කළ පාලකයින් නම් කරන්න.

**A -** මුළු දිවයිනම ප්‍රථම වරට එක්සේසත් කිරීම

**B -** පළමුවරට අනුරාධපුර නගරය සැලසුම් සහගත නගරයක් ලෙස ගොඩනැඟීම

**C -** මෞර්ය සම්ප්‍රදායට අනුව පංච කකුධ භාණ්ඩ භාවිත කර දෙවන වර අභිෂේක වීම

**D -** සෑෂිගිරි ඇමතිවරයා ලවා යාපනය ප්‍රදේශය පාලනය කරවීම **(ලකුණු 04)**

**(III)** වසභ රාජ්‍ය කාලයේ වැදගත්කම, කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න **(ලකුණු 05 )**

**(IV)** පොළොන්නරුව රාජධානිය පරිහානියට හා බිඳ වැටීමට තුඩු දුන් හේතු තුනක් විස්තර කරන්න **(ලකුණු 06)**

**04 (I)** පහත සඳහන් ගංගා නිම්නවල පිහිටුවා ඇති පාලන මධ්‍යස්ථාන **A ,B ,C** අනුපිළිවෙලින් ලියා දක්වන්න.

**A -** කිරිඳිඔය

**B -** මල්වතු ඔය

**C -** මහවැලි ගඟ **(ලකුණු 03)**

**(II)** පහත **A B** හා **C**වලින් දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ මොනවාදැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

**A -** මැටි බඳුන් සැකසීම සඳහා යොදාගත් තාක්ෂණික උපාංගය

**B -** පීඩන ශල්කනය යොදාගනිමින් තැනූ මෙවලම් විශේෂය

**C -** ජල තරංගවලින් ඇතිවන බලය නිසා වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීමට ඉදිකර තිබෙන ව්‍යුහය

**D -** රුවන්වැලි මහා සෑය අකුණු පහරින් ආරක්ෂා කිරීමට යොදාගත් උපකරණය

( වජ්‍ර චුම්බට, ජ්‍යාමිතික ශුද්‍ර මෙවලම්, සොරොව්ව, රළපනාව, සකපෝරුව, කටාරම , පිටවාන,බෝධිසර)

**(ලකුණු 04)**

**(III)** අතීත ශ්‍රී ලංකාවේ මහවැව් ඉදිකිරීමේ අරමුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 05)**

**(IV) A -** පිටවාන

**B -** සොරොව්ව

**C -** බිසෝකොටුව

**D -** වැව් බැම්ම

යන වැවක දක්නට ලැබෙන තාක්ෂණික අංග අතුරින් දෙකක නිර්මාණය හා කාර්යය පිළිබඳ විස්තර කරන්න **(ලකුණු 06)**

05 (I) පහත අවස්ථාවල දි අසල්වැසි රාජ්‍යයන් සමඟ සුහදව කටයුතු කළ රජවරු තිදෙනා A, B,C අනුපිළිවෙළින් නම් කරන්න .

A - වීදුරු පබළු රැගෙන ඒමට රෝම දේශයට දූතයන් යැවීම.

B - පත්තිනි දේවාලයක් විවෘත කිරීමට ඉන්දියාවට යාම.

C - විසිවතාවක් චීනයට දූත ගමන් සිදුකිරීම . (ලකුණු 03)

(II) පහත සඳහන් සෙල්ලිපිවලින් දැක්වෙන කර්මාන්ත A, B,C,D අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - මුතුගල්ල සෙල්ලිපිය .

B - මණ්ඩගල සෙල්ලිපිය.

C - වෙහෙරකෙම සෙල්ලිපිය.

D - වෙගිරිය සෙල්ලිපිය. (ලකුණු 04)

(III) බුදු දහම මෙරට සමාජයේ මුල්බැස ගැනීමෙන් පසු අනුරාධපුර යුගයේ අධ්‍යාපනය කටයුතු සිදු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(IV) අතීත ශ්‍රී ලාංකිකයන් වාර්ගික සහජීවනයෙන් ජීවත් වූ බව නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06 (I) පහත දක්වා ඇති කරුණු වලට අදාළ පිළිතුරු A B C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - යාපනය රාජධානියේ පාලක පරපුර හැඳින්වූ නම

B - කුරුණෑගල රාජධානියේ ප්‍රථම පාලකයා

C - vi වන බුවනෙකබාහු රජුගේ දැදිගම අභයදාන ශිලා ලිපියෙන් නිදහස ලැබූ කැරලි නායකයා (ලකුණු 03)

(II) හය වන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස සැලකීමට තුඩුදුන් සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(III) දෙවන රාජසිංහ රජු මුහුණ දුන් අභියෝග දෙකක් දක්වා සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(IV) උඩරට රාජධානියේ මධ්‍ය පාලනය සිදු වූ ආකාරය, අංශ තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06)

07 (I) A - 1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට මෙරටට එවන ලද සාමාජිකයන් දෙදෙනා,

B - ලංකා සංගමය ආරම්භ කිරීමට පුරෝගාමී වූ යුරෝපීය ජාතිකයා,

පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)

(II) කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(III) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දුන් නවාංග දෙකක් සැකවින් විස්තර කරන්න. (ලකුණු 05)

(IV) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද ඡන්ද විමසීම් ක්‍රම තුන පැහැදිලි කරන්න. (ලකුණු 06)

**III කොටස**

**08 (I)** කාර්මික විප්ලවය ප්‍රධාන කර්මාන්ත තුනක් ඇසුරින් සිදු විය .එම කර්මාන්ත තුන නම් කරන්න.

(ලකුණු 03)

**(II)** දහනවවන සියවසේ දී වෙනත් රටවලට කාර්මීකරණය ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(ලකුණු 04)

**(III)** කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ වෙනත් ක්ෂේත්‍ර දෙකක් ලියා, එය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

**(IV)** කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 06)

**09 (I)** පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු යුරෝපයේ බිහි වූ නව රාජ්‍යයන් තුනක් නම් කරන්න

(ලකුණු 03)

**(II)** පහත A සිට D දක්වා ඇති තොරතුරු සඳහා අදාළ වන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න .

A- සමාජ සම්මුතිය නම් කෘතිය තුළින් ජනතා පරමාධිපත්‍යය සංකල්පය ඉදිරිපත් කිරීම

B- ජාතීන්ගේ සංගමය ආරම්භ කිරීම සඳහා මුල් වී කටයුතු කළ ඇමරිකා එක්සත් ජනපද ජනාධිපතිවරයා

C- ඉතාලියේ මුසෝලිනී විසින් ක්‍රියාත්මක කරන ලද දේශපාලන ක්‍රමය

D- සූවස් ඇල ජනසතු කිරීම සඳහා මූලිකත්වය ගත් මිසර ජනාධිපතිවරයා

(මොන්ටෙස්කියු, වුඩ්රෝ විල්සන් ,නාට්සිවාදය,ෆැසිස්ට්වාදය ,අබ්දුල් ගමාල් නසාර් , ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් ,රූසෝ ) (ලකුණු 04)

**(III)** ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

**(IV)** වර්තමාන ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

*****